හෙළකුල කතුන්ගේ සතියේ
පිරිපුන් කියැවීම් සංග්‍රහය
රැජිණ
RAJINA
THE WOMAN'S WEEKLY
පුවත්පතක් වශයෙන්
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

කර්තෘ
තිලක් සේනාසිංහ
නියෝජ්‍ය කර්තෘ
ඉන්දු පෙරේරා
පිටු සැලසුම් - සුරංජිත් ගුණසේකර
පරිගණක පිටු සැකසුම්
නුවන් අසංක
විදුරංග විතානගේ

මුද්‍රණය, ප්‍රකාශනය හා
බෙදාහැරීම
සීමාසහිත
ලක්බිම නිව්ස් පේපර්ස්
ප්‍රයිවට් ලිමිටඩ්
අංක 445/1, සිරිමාවෝ
බණ්ඩාරනායක මාවත,
කොළඹ 14

කර්තෘ මණ්ඩලය
දුරකථන අංක
2441895
2330673-4 2435225
2343406-9 2449884
ෆැක්ස් : 2441896
බෙදාහැරීමේ අංශය
දුරකථන අංකය 2343410

දැන්වීම් කාර්යාලය
සුමති කෝට්, 491, ගාලු පාර, කොළඹ 03
දැන්වීම් කළමනාකරු :- 011-4368627 පොදු :- 011-4368629
ෆැක්ස් : 011-4518313
කොටුව ශාඛාව: අංක 12, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත
කොළඹ 02 (රීගල් සිනමා ඉදිරිපිට)
දුරකථන අංක : 011-24399466/011-2439467
මහනුවර ශාඛාව : 77,කොටුගොඩැල්ල වීදිය, මහනුවර.
දුරකථන අංක : 081-2223143








# වස විස මුසු නැති ලියූ මැල්ලුම් පැකට් වෙළෙඳපොළට හඳුන්වා දුන් ජානකී

සි මබල ආහාර වේලකට මැල්ලුම් වර්ග අනිවාර්යයෙන්ම අඩංගුවිය යුතු බව අප බොහෝ දෙනෙක් දන්නා කාරණයකි. එනමුත් අප වැඩි දෙනෙකුගේ කෑම පිඟානට අඩුවෙන්ම එක්වන අංගයත් මැල්ලුම්ය.

මැල්ලුම් වර්ග ආහාරයට එක් කර ගැනීම ඉතා වැදගත් බව බොහෝ ගෘහණියන් දන්නා කාරණයක් වුවත් මැල්ලුමක් සකස්කර ගැනීමට කාලවේලාවක් වෙන්කර ගැනීම අපහසු වීම මෙයට හේතුවයි. වර්තමානයේ කාන්තාවන් රැකියා හා එදිනෙදා නිවසේ කටයුතු නිසා අධික කාර්යබහුල වීම මත වේල පිරිමසා ගැනීම සඳහා පහසු ආහාර වර්ගයක් පිළියෙළ කිරීම සිදුවේ. එවිට මැල්ලුම් සකස් කර ගැනීම සඳහා කාලවේලාවක් වෙන් කර ගැනීම ඔවුනට අසීරු වෙයි.

නමුත් දැන් වෙළෙඳපළෙන් ඉතා සෞඛ්‍යාරක්ෂිතව තැනූ කපන ලද මැල්ලුම් වර්ග මිලදී ගැනීමට හැකියාව තිබේ. ත්‍රී ස්ටාර් ෆාම් නිෂ්පාදනයක් ලෙසින් වෙළෙඳපළට නිකුත්වන මෙම නිෂ්පාදනවල හිමිකාරීත්වය දරන්නේද කාන්තාවක් වීම සුවිශේෂය. ඇය නමින් ජානකී කත්‍රිආරච්චිය.



දරුවන් තිදෙනෙකුගේ මවක වන ජානකී තම ව්‍යාපාරයේ ඇරඹුම ගැන මෙසේ පැහැදිලි කළාය.

"දරුවනුත් එක්ක අනික් වැඩ කොහොම හරි කරගත්තත් මැල්ලුම් ලියන්නනම් වේලාවක් හොයාගන්න හරිම අමාරු වුණා. දරුවන්ට මැල්ලුම් කවන්න ඕන බව දන්නවා. ඒත් හැම සුමානෙම ගෙදරට මැල්ලුම් මිටි පහක් ගෙනාවොත් තුනක්වත් පිළියෙළ කරගන්න වේලාවක් නැතිව විසි කරනවා.

මේකට විසඳුමක් බලාපොරොත්තුවෙන් මම දවසක් ගොටුකොළ මිටි කිහිපයක් හීනියට ලියල ශීතකරණයේ දැම්මා. ඒක ඊළඟ දවසේ හොඳට තිබුණා. ඒත් දවස් දෙකක් පහුවෙනකොට නරක් වුණා. නමුත් මගේ උත්සාහය අත් නොහැර නොයෙකුත් පර්යේෂණ කරමින් ඉදිරියට ගිහින් අද සාර්ථක ව්‍යාපාරයක් දක්වා රැගෙන ඒමට හැකියාව ලැබී තිබෙනවා.

මැල්ලුම් කල් තබා ගැනීමේ තාක්ෂණය සොයා ඇයට බොහෝ සෙයින් වෙහෙස මහන්සි වීමට සිදුවිය. රසායනාගාරවල අවස්ථා ගණනාවක් රස්තියාදු වූවාය. ඇයට මෙම කාර්යයේදී බොහෝ අය වෙතින්ද දිරිගැන්වීම් වෙනුවට ලැබුණේ සිත අධෛර්යමත් කරන උපදේශයන්ය. නමුත් දිරිය කාන්තාවක් ලෙස තමන්ගේ අරමුණ තුළම ඉදිරියට ගමන් කරමින් අද ඇය සියලු අභියෝග පරාජය කර ජය මාවතකට පිවිස සිටින්නීය.





"මගේ උත්සාහය සාර්ථක වුණාට පස්සේ හොඳින් ඇසුරුම් කළ පැකට් පහක් සුපිරි වෙළෙඳ සලක අලෙවියට තැබුවා. ඒත් ඉන් හතරක්ම නැවත මට නිවසට ගෙන ඒමට සිදුවුණා. ඊළඟ දවසෙත් මම පැකට් පහක් වෙළෙඳ සලට දැම්මා. එදා පැකට් තුනක් ඉතිරි වුණා. නමුත් ඊට පස්සේ ටිකෙන් ටික ඉල්ලුම වැඩිවුණා. අපේ නිෂ්පාදන ඊට පස්සේ සුපිරි වෙළෙඳ සල් ගණනාවකට දැම්මා. ඒවායේ හොඳ ඉල්ලුමක් දවසින් දවස ඇතිවුණා. අද අපි බස්නාහිර පළාතේ සුපිරි වෙළෙඳ සල් බොහොමයකටත්, ගාල්ල මාතර වැනි ප්‍රදේශවල සුපිරි වෙළෙඳ සල්වලටත් අපේ නිෂ්පාදන නිකුත් කරනවා." ජානකී තම ව්‍යාපාරයේ සාර්ථකත්වය ගැන පැහැදිලි කළේ එලෙසිනි.

කරුණාකර 07 පිටුව බලන්න

සටහන
**සුරංජිත් ගුණසේකර**